*සැ. යු.* - 2013.07.05 වැනි දින පළ වූ අංක 1,818 දරන *ගැසට් පත්‍රයේ* I:III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,819 - 2013 ජූලි මස 12 වැනි සිකුරාදා - 2013.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 614 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 614 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 616 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 614 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 621 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) ශ්‍රී සිද්ධාර්ථ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 229

DRF/21/RECT/3322.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අනිවාර්යය විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2011 ඔක්තෝබර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් විතාරන බෙනට් ආර්ඩබ්පී ශ්‍රීලපාභ (නි/62992)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

07-237

DRF/21/RECT/2944.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති
සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2009 ජූලි මස 14 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිතන් කිරිම්බුර සුරංග ලියනගේ ශ්‍රීලපාභ (නි/64621)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-236

# වෙනත් පත්කිරීම් ආදිය

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ පහත නම සඳහන් නිලධාරියා 2013 ජුනි මස 10 වැනි දින සිට අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහකෙරේ.

ලුතිනන් ලියනගේ ශාන්ත පෙරේරා, එන්ආර්එක්ස් 0526, ශ්‍රීලංනාහ

ජේඑස්කේ කොළඹගේ, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

02-320

# රජයේ නිවේදන

**වන්දනා ගමන් ආඥාපනත**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ 2013 වාර්ෂික ඇසළ උත්සවය 2013 ජූලි මස 16 වැනි අඟහරුවාදා සිට 2013 ජූලි මස 29 වන සඳුදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ (175 වන පරිච්ඡේදය) රෙගුලාසිවල 10 වැනි වගන්තිය අනුව 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

ඊ. ඒ. සී. විදානගමාච්චි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති (වැ.බ.),
මාතර.

2013 ජුනි මස 22 වැනි දින,
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-321

**පෙරියකට්ටු ශාන්ත අන්තෝනි දේවමැදුරේ උත්සවය - 2013**

ඉහත සඳහන් උත්සවය 2013 ජූලි මස 26 වැනි දින ආරම්භ කර 2013 අගෝස්තු මස 04 වැනි දින අවසන් කරන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. මේ පිළිබඳව 1949.05.27 වැනි දින අංක 9978 සහ 1950.05.26 දින අංක 10105 දරන *ගැසට් පත්‍රවල* පළමු නිවේදනවලට පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගු වනවා ඇත.

එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර,
දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
වවුනියාව.

2013 ජූනි මස 17 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය.

07-325

---

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2013

ඉහත සඳහන් උත්සවය 2013 අගෝස්තු මස 07 වැනි දිනෙන් ආරම්භ වී 2013 අගෝස්තු මස 21 වැනි දින නිමාවට පත් වන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධි විධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනතාවගේ අවධානයට ලක් කරමි.

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*
1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*
1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*
1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*
1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය*

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කතරගම ඇසළ උත්සව කඳවුරුභාර නිලධාරී.

2013 ජූනි මස 18 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-216/1

---

**රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2013**

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*, 1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*, 1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*, 1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*, 1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පළ වූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. *කඳවුරු ප්‍රදේශය යනු :*

(අ) කතරගම මැණික් ගඟේ පැරණි තොටුපළේ සිට කිලෝමීටර් 1.6 ක අර්ධ විෂ්කම්භයකින් වට වූ ප්‍රදේශය හා,
(ආ) සෙල්ලකතරගම පුල්ලෙයාර් කෝවිලේ සිට කිලෝමීටර් 0.4 ක අර්ධ විශ්කභයකින් වට වූ ප්‍රදේශය,

02. *ගොඩනැගිලි ඉදිකිරීම :*

මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලිඛිත අවසරයක් නොමැතිව කිසිවකු විසින් හෝ 2013 අගෝස්තු මස 07 වැනි දින සිට 2013 අගෝස්තු මස 21 වැනි දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳ සැලක් ඉදි නොකල යුතු ය.

03. *යාචකයෝ :*

කතරගම මැණික් ගඟේ 02 වන පාලම අසල තනා ඇති යාචක මඩුව තුළ හෝ ඒ මඩුවේ සිට මීටර් 4 ක් ඇතුළත මිස, පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකල යුතුයි.

04. *නෑම සහ සේදීම :*

මැණික් ගඟේ කතරගම ජලසම්පාදන ක්‍රමය හරහා ජලය ලබා ගන්නා ස්ථානයට සහ ඊට ඉහලින් කිලෝමීටර් 4.8 ක ප්‍රදේශය තුළ මැණික් ගඟේ කිසිවෙකු දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම නොකල යුතු ය.

05. *වාහන :*

5.1 මාගේ හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසරයක් රහිතව කිසිවකු විසින් මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක්, හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (මැණික් ගඟේ නැගෙනහිර පෙදෙසට) පැදවීම හෝ ඇතුල් කිරීම නොකල යුතු ය.

5.2 කඳවුරට අයත් නව නගරයේ වාහන නතර කිරීමට වෙන් කර ඇති රිය ගාල් වල හැර කිසිදු වාහනයක් වෙනත් ස්ථානයක නතර කර නොතැබිය යුතු ය.

06. *කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානය :*

කඳවුරු පෙදෙසේ මවිසින් අවසර දුන් ස්ථානයේ හැර කිසිවෙකු විසින් කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක් පිහිටුවනු නොලැබිය යුතු ය.

07. *කාවාඩි කඩ :*

මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවකු විසින් කාවාඩි කඩ පිහිටුවනු නොලැබිය යුතු ය.

08. *වෙළඳාම :*

8.1 පූජා පෙදෙස, වන්දනා කරුවන්ගේ විශ්‍රාමශාලා ප්‍රදේශය, නැවතුම්පොල, අංක 1 හා 2 මගී පාලම්වල මාර්ගය යන ස්ථානවල සංචාරක වෙළඳාම තහනම් ය.

8.2 මවිසින් ඒ සඳහා අවසරදුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකල යුතු ය.

8.3 කිරි වෙහෙරට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට තනා ඇති මල් අලෙවිසැල්වල මල් අලෙවි කිරීම හැර කිසිවෙකු විසින් පූජා නගරය තුළ කඩයක් තැනීම, පවත්වාගෙන යාම, කිසිවක් වෙළඳාම් කිරීම නොකල යුතු ය.

8.4 සෑම ගොඩනැගිල්ලකම හා සෑම වෙළඳසැලකම කසල බඳුනක් තිබියයුතු අතර, ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතු ය.

8.5 විකිණීමට තබා ඇති සකස් කල සියළු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටි වල රඳවාතැබිය යුතුය.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කතරගම ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2013 ජූනි මස 18 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-216/2

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන 2010

**දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

(ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)

| | *2010 දෙසැ. 31 දිනට* | *2009 දෙසැ. 31 දිනට* |
|---|---|---|
| **වත්කම්** | | |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් | 179,020,200 | 179,020,200 |
| ගොඩනැගිලි | 588,541,261 | 590,110,414 |
| කාර්යාල උපකරණ | 60,636,229 | 25,750,798 |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 188,285,501 | 156,283,921 |
| වාහන | 17,823,821 | 10,343,762 |
| ජල සැපයීම් යෝජනා ක්‍රමය | 1 | 1 |
| දුරකථන නාම පුවරුව | 1 | 1 |
| විදුලිය සැපයීමේ යෝජනා ක්‍රමය | 1 | 1 |
| ක්‍රීඩා උපකරණ | 585,718 | 1,143,488 |
| උපාධි ලෝගු | 1,020,333 | 1,521,385 |
| පුස්තකාල පොත් | 42,145,385 | 42,125,439 |
| ලීබඩු හා සවිකිරීම් | 59,968,522 | 43,781,260 |
| වෙනත් වත්කම් | 223,283 | 25,860 |
| ***උප එකතුව*** | **1,138,250,257** | **1,050,116,530** |
| කෙරීගෙන යන වැඩ | 3,732,551 | 3,104,826 |
| ආයෝජන | **101,245,208** | **57,170,954** |
| ජංගම වත්කම් | | |
| ගබඩා තොග | 26,569,101 | 23,719,611 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 115,999,898 | 114,733,377 |

| | *2010 දෙසැ. 31 දිනට* | *2009 දෙසැ. 31 දිනට* |
|---|---|---|
| සේවක ණය සහ අත්තිකාරම් | 71,759,856 | 54,306,006 |
| අත්තිකාරම් හා ඉදිරියට කළ ගෙවීම් | 71,324,287 | 76,046,607 |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය | 24,700,000 | 25,742,095 |
| මුදල් හා මුදල් සමාන විෂයයන් | 94,678,878 | 132,163,744 |
| **උප එකතුව** | **405,032,019** | **426,711,440** |
| **වත්කම් එකතුව** | **1,648,260,034** | **1,537,103,749** |
| **අරමුදල් හා වගකීම්** | | |
| ප්‍රාග්ධනය | | |
| මූලධන ආධාර - වැයවූ | 2,060,956,367 | 1,962,512,285 |
| මූලධන ආධාර - වැය නොවූ | 10,394,592 | 16,971,196 |
| විශේෂ ව්‍යාපෘති IRQUE (IDA Credit - 3781 CE) | 138,044,944 | - |
| ත්‍යාග හා ප්‍රදාන | 368,303,394 | 411,220,566 |
| | **2,577,699,298** | **2,390,704,047** |
| **සමුච්චිත අරමුදල** | | |
| පොදු සංචිතය | (1,526,773,190) | (1,391,660,775) |
| **සංචිත හා අරමුදල්** | | |
| විශේෂ සංචිත | 7,360,157 | 7,330,809 |
| ප්‍රාග්ධන සංචිතය | 25,694,931 | 26,429,337 |
| පරිත්‍යාග අරමුදල් | 19,458,209 | 15,154,741 |
| පර්යේෂණ ආධාර | 7,246,904 | 7,636,599 |
| ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 161,530,617 | 140,689,071 |
| | **221,290,819** | **197,240,557** |
| **ජංගම නොවන වගකීම** | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | **265,123,699** | **248,190,381** |
| ජංගම වගකීම් | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 27,977,056 | 33,773,878 |
| උපචිත වියදම් | 67,051.123 | 42,617,834 |
| ගෙවිය යුතු | 15,891,229 | 16,237,828 |
| | **110,919,409** | **92,629,540** |
| අරමුදල් හා වගකීම්වල එකතුව | **1,648,260,034** | **1,537,103,749** |

| අත්සන් කලේ : | අත්සන් කලේ : | අත්සන් කලේ |
|---|---|---|
| ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න | ජේ. මුත්තෙට්ටුවේගෙදර | ඒ. අයි. එන් පැස්කුවල් |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |

2011 මැයි මස 12 වන දින

**2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශනය**
(ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)

| *මෙහෙයුම් ආදායම* | *2010* | *2009* |
|---|---|---|
| | *(රු.)* | *(රු.)* |
| **රජයේ ආධාර** | | |
| පුනරාවර්තන | 954,990,000 | 861,870,000 |

| *මෙහෙයුම් ආදායම* | *2010 (රු.)* | *2009 (රු.)* |
|---|---|---|
| මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 10,526,509 | 26,047,301 |
| ශ්‍රී.ල.වි.වි. ක්‍රීඩා තරගාවලිය සඳහා වි.ප්‍ර.කො. අතිරේක ප්‍රතිපාදන | 5,000,000 | - |
| 50 වැනි සංවත්සරය සැමරීම | - | 19,133,402 |
| ශිෂ්‍යාධාර | 48,499,600 | 32,244,700 |
| මහපොළ ශිෂ්‍යත්ව | 146,697,600 | 119,561,250 |
| අභ්‍යන්තර ආදායම් | 175,021,719 | 196,658,865 |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | 44,907,656 | - |
| ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් | 22,244,365 | 25,583,171 |
| **මුළු ආදායම** | **1,407,887,450** | **1,281,098,688** |
| *මෙහෙයුම් වියදම්* | | |
| *අඩුකළා :* මෙහෙයුම් වියදම් | | |
| සේවක වැටුප් හා දීමනා | 760,632,788 | 725,834,989 |
| ගමන් වියදම් | 4,925,505 | 4,123,584 |
| සැපයීම් | 68,168,715 | 52,228,469 |
| නඩත්තු සේවා | 13,636,571 | 4,038,316 |
| කොන්ත්‍රාත් සේවා | 158,329,080 | 132,934,802 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 90,520,819 | 46,727,641 |
| පර්යේෂණ හා සංවර්ධන | 4,351,533 | 4,495,371 |
| ක්ෂයවීම් | 133,703,223 | 104,618,691 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10,526,509 | 26,047,301 |
| 50 සංවත්සර අධ්‍යාපන ප්‍රදර්ශනය සහ වෙනත් අදාල | - | 19,133,402 |
| ශිෂ්‍යාධාර | 48,499,600 | 32,244,700 |
| මහපොළ ශිෂ්‍යත්ව | 146,697,600 | 119,561,250 |
| ස්වයං මූල්‍ය පාඨමාලා වියදම් | 22,244,365 | 25,583,171 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | **1,462,136,309** | **1,297,571,687** |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය*** | **(54,248,859)** | **(16,472,998)** |
| පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | (1,391,660,776) | (1,298,206,211) |
| ශුද්ධ ඌනතාවය - පෙර වර්ෂ ගැලපීම්වලට ප්‍රථම | (1,445,909,635) | (1,314,679,209) |
| පෙර වර්ෂ ගැලපීම් | (80,863,555) | (76,981,567) |
| පොදු සංචිතය ඉ/ගෙ | **(1,526,773,190)** | **(1,391,660,776)** |

**2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *2010.12.31 දිනට (රු.)* | *2009.12.31 දිනට (රු.)* |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය*** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ඌනතාවය/අතිරික්තය | (54,248,859) | (16,472,998) |
| *එකතු කළා :* මුදල් නොවන අයිතම | | |
| ක්ෂය කිරීම | 133,703,223 | 104,618,691 |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 28,568,426 | 20,553,332 |
| පාරිතෝෂික ගෙවීම් | (11,635,108) | (14,050,244) |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (44,907,656) | - |
| පෙර වර්ෂ ගැලපීම් | (80,863,555) | (76,981,567) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | **(29,383,530)** | **17,667,214** |

| | *2010.12.31 දිනට (රු.)* | *2009.12.31 දිනට (රු.)* |
|---|---|---|
| තොගය (වැඩිවීම/අඩුවීම) | (2,849,490) | (4,922,454) |
| ණයගැතියෝ සහ ලැබිය යුතු (වැඩිවීම/අඩුවීම) | (1,266,521) | 3,127,006 |
| සේවය ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | (17,453,850) | (1,910,878) |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | 4,722,321 | 1,520,918 |
| මූලධන වෙන් කිරීම (වැඩිවීම/අඩුවීම) | (734,406) | (300) |
| උපචිත වියදම් (වැඩිවීම/අඩුවීම) | 24,433,289 | 19,622,449 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | (5,796,822) | 3,464,269 |
| භාණ්ඩාගාර තැන්පත් (වැඩිවීම/අඩුවීම) | 1,042,095 | - |
| අනෙකුත් ජංගම වගකීම් (වැඩිවීම/අඩුවීම) | (346,599) | 5,573,977 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(27,633,513)** | **44,142,200** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (89,561,767) | (169,681,530) |
| ආයෝජන | (44,074,254) | (29,363,242) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහන | **(133,636,021)** | **(199,044,772)** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය | | |
| මූලධන ආධාර | 92,000,000 | 178,000,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි.ප්‍ර.කො.) | - | 2,500,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) ව්‍යවහාරික විද්‍යා පීඨය | 3,000,000 | 5,000,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) කළමණාකරන අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 3,000,000 | - |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි.ප්‍ර.කො)පුස්තකාලය | 1,000,000 | - |
| අභ්‍යන්තර මුදල් මාරු කිරීම | - | 24,210,000 |
| පරිත්‍යාග අරමුදල් | 4,303,468 | 5,179,358 |
| විශේෂිත අරමුදල් | 29,348 | 5,920,718 |
| පර්යේෂණ අරමුදල් | (389,695) | 1,008,331 |
| ව්‍යාපෘති පාඨමාලා | 20,841,546 | 24,594,168 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | **123,784,668** | **246,412,576** |
| | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑවලින් සිදුවූ ශුද්ධ වෙනස | (37,484,866) | 91,510,004 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 1) | 132,163,744 | 40,653,740 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 1) | **94,678,878** | **132,163,744** |

*සටහන 1*

| | *2010.12.31 දිනට (රු.)* | *2009.12.31 දිනට (රු.)* |
|---|---|---|
| මුදල් හා මුදල්වලට සමාන දෑ විග්‍රහය | | |
| | | |
| භාණ්ඩාගාර අරමුදල් | | |
| මහජන බැංකුව ගංගොඩවිල - ගි/අ 097-1001-6-2315454 (පුනරාවර්තන ආධාර) | 5,701,170 | 1,054,119 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1001-3-2315455 (මූලධන ආධාර) | 9,011,552 | 11,340,002 |
| මහජන බැංකුව, ආයතනික ශාඛාව - ගි/අ 004-1-001-0-0210877 | 29,101 | 5,022 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1001-9-2315457 (වෛද්‍ය පීඨය) | 2,183,856 | 99,158 |
| **උප එකතුව** | **16,925,679** | **12,498,301** |
| | | |
| භාණ්ඩාගාර නොවන අරමුදල් | | |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315467 (පශ්චාද් උපාධි පීඨය) | 13,937,994 | 5,111,920 |
| මහජන බැංකුව, ගංගොඩවිල- ගි/අ 097-1-165-0034200 (සංවර්ධන අරමුදල) | 170 | 170 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-1001-6-2315473 (සීඩා සරෙක්) | 1,388,034 | 24,031,033 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-2315474 (සීඩා සරෙක්) | 575,276 | 1,507,260 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315472 (ශිෂ්‍ය සහන අරමුදල) | 140,723 | 96,533 |

| | 2010.12.31 දිනට (රු.) | 2009.12.31 දිනට (රු.) |
|---|---|---|
| මහජන බැංකුව, ගංගොඩවිල ගි/අ 097-1-001-1- 2315456 (බාහිර විභාග ඒකකය) | 36,185,762 | 77,498,073 |
| මහජන බැංකුව, ගංගොඩවිල ගි/අ 097-1-001-7-0000-629 (50 වැනි සංවත්සර අරමුදල් ගිණුම) | 108,220 | 108,220 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-0002229 (කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල) | 18,295,210 | 8,897,154 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-5-0003105 (ශාස්ත්‍ර පීඨ අරමුදල) | 5,033,335 | 1,016,167 |
| මහජන බැංකුව, ගංගොඩවිල ගි/අ 097-1-001-4-7709343 (සංවර්ධන අරමුදල - වෛද්‍ය පීඨය) | 1,894,013 | 1,160,234 |
| **උප එකතුව** | **77,558,739** | **119.426,766** |
| සුළු මුදල් අග්‍රිමය | | |
| පොදු ගිණුම | 106,704 | 97,318 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | 23,634 | 31,634 |
| වෛද්‍ය පීඨය | - | 3,773 |
| බාහිර විභාග ඒකකය | 13,122 | 5,953 |
| උප එකතුව | **143,460** | **138,677** |
| මුදල් සංචිතය | 51,000 | 100,000 |
| **එකතුව** | **94,678,878** | **132,163,744** |

**2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා**

මූල්‍ය වාර්තාවල අදාළ සටහන්

**වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

1. පොදු

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත. වත්කම් අත්පත් කර ගන්නා දිනට පවත්නා වටිනාකම අනුව ගණුදෙනු සටහන් කර ඇති අතර, වගකීම දැරීම හා අරමුදල් ලැබීම සාමාන්‍ය පිළිගත් ගිණුම් ප්‍රතිපත්තීන් වලට අනුකූලව පෙර වර්ෂයන්හි භාවිතා කළ ක්‍රම වලට අනුකූලව සිදුකර ඇත.

2. වත්කම් හා එහි වටිනාකම් ගණනය කිරීමේ පදනම

2.1 දේපළ, පිරියත, උපකරණ හා ක්ෂය

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගයට පෙන්වා ඇත. සියලුම වත්කම් මිලදී ගත් පිරිවැය සහ අනෙකුත් වියදම් වටිනාකමට සටහන් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම්හි වටිනාකම් එහි පිරිවැය මත ගණනය කර ඇත.

ශ්‍රී.ල.ගි.ප්‍ර අංක 24 ට අනුව පරිත්‍යාග ලෙස ලද දේපළ පිරියත හා උපකරණවල වටිනාකම ප්‍රාග්ධනිත කර හා එහි ඵලදායී ආයු කාලය මත ක්‍රමක්ෂය කර ඇත (සටහන් 12)

වත්කම්වල ඇස්තමේන්තු ගතකළ භාවිතයට ගතහැකි කාලය තුළ පිරිවැය කපා හැරෙන පරිදි පහත සඳහන් රේටයන්ට අනුව සරල මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි - සවිකිරීම් ඇතුළුව | 5% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පොත් හා වාර සඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| උපාධි ලෝගු | 20% |
| ක්‍රීඩා භාණ්ඩ | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් (ජල සැපයුම්, විදුලි හා දුරකථන) | 10% |

2.2 තොගය

ගබඩා තොග වටිනාකම ගණනය කිරීම සඳහා පළමුවෙන් ලැබීම් පළමුවෙන් නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ගබඩා තොග භෞතික වශයෙන් ගණනය කර ශේෂ පත්‍ර දිනට වටිනාකම ගණනය කරනු ලැබේ.

2.3 සේවකයින්ට ගෙවනු ලබන ණය අත්තිකාරම්

සේවකයින්ගෙන් අයකර ගැනීමට නියමිත ණය මුදල ලැබිය යුතු මුදල ලෙස ගණනය කර ඇත.

3. පාරිතෝෂික සඳහා වෙන් කිරීම

විශ්වවිද්‍යාල සේවයේ වර්ෂ 05 ක සේවා කාලයක් ඇති කාර්යය මණ්ඩලය සඳහා පමණක් පාරිතෝෂික ගණනය කර වෙන් කිරීම් කරනු ලැබේ. මෙම වෙන් කිරීම සඳහා අභ්‍යන්තර වශයෙන් අරමුදල් පිහිටුවා නැත.

4. උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම

ඇස්තමේන්තු හා ලැබී ඇති ලිපිලේඛනවල තොරතුරු මත උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

5. ලැබිය යුතු මුදල්

ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් 2010.12.31 වැනි දිනට රු. 83,169,634.61 ක මුදලක් කාර්ය මණ්ඩලයෙන් අයකර ගැනීමට ඇත.

6 ආධාර සඳහා ගිණුම්කරණය

පුනරාවර්ථන ආධාර ආදායම් හා වියදම් ගිණුමේ ලැබීම් පදනම මත හඳුනා ගෙන ඇත. ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා මූලධන ආධාර කෙරිගෙන යන වැඩ හෝ මූලධන වත්කම් ලෙස හඳුනාගෙන ඇත.

7. ආදායම හඳුනාගැනීම

පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ආධාර, ශිෂ්‍යාධාර හා මහපොළ මුදල් පදනම මත හඳුනාගනී.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 වැනි දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

07-230

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 980020.

තට්ටගේ සුගත් ජයශාන්ත ප්‍රනාන්දු.

2013 මාර්තු මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පී. ජී. ආර්. ජයවර්ධන විසින් 2011 ඔක්තෝබර් මස 20 වැනි දින සහතික කරන ලද අංක 7629 දරන දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තට්ටගේ සුගත් ජයශාන්ත ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් පන්ලක්ෂ විසිදහස් පන්සිය විසිනමයයි ශත දහයක (රු.5,520,529.10) මුදලක් 2013 මාර්තු 5 වැනි දින වන විට

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස් පන්ලක්ෂ විසිදහස් පන්සිය විසිනමයයි ශත දහයක (රු.5,520,529.10) මුදල අයකර ගැනීම සඳහා සහ 2013 මාර්තු 6 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 5,204,649.02 ක මුදල මත 11.5% වැඩිපුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 7629 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ තෙවන මහලේ අංක 182 දරන ස්ථානයේ පිහිටි හි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ කටුනායක සීදුව නගර සභා සීමාව තුළ අමන්දොලුව ගමේ පිහිටි ඇටඹගහවත්ත කැටකෙලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වර්ඩ් විසින් 2007 අප්‍රේල් 16 වැනි දින මැන සාදන ලද අංක 4272 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : වයලට් සිල්වාගේ ඉඩම ද, නැගෙනහිරට : ශිරෝමි සේනාරත්නගේ ඉඩම ද, දකුණට : ලොට් 13 සහ බස්නාහිරටː ලොට් 3 මායිම් වූ පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වූ ඉඩම මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 929/287 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 4272 හි ලොට් 13 වශයෙන් දැක්වෙන අඩි 20 පළලැති මාර්ග වෙන් කිරීම මතින් වූ පූර්ණ පරිහරණ හා පිවිසුම අයිතිය සමග වේ.

ආර්. ආර්. දුනුවිල මිය,<br>සමාගම් ලේකම්.

07-357

---

### මහජන බැංකුව - ආයතනික බැංකුමය කටයුතු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.06.29 වැනි දින පැවැති රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සහ ව්‍යාපාර ලියාපදිංචි අංක පී.වී. 4830 යටතේ ද තම සිය ලියාපදිංචි කාර්යාලය ගම්පහ බණ්ඩාර වත්ත යක්කල පාර, අංක 70/1 දරන ස්ථානයේ පවත්වාගෙන යන සීමාසහිත M/S P.N. කාර් සේල්ස් (පෞද්ගලික) සමාගම විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඩී. ද සිල්වා සිරිසේන මහතා විසින් 2009.10.02 වැනි දින සහතික කරන ලද අංක 414 දරන උකස්කරය මත සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. ආර්. මෙන්ඩිස් මහතා විසින් 2011.07.22 වැනි දින සහතික කරන ලද අංක 5386 දරන උකස්කරය ප්‍රකාරවද ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එමගින් එකී සීමාසහිත M/S P. N. කාර් සේල්ස් (පෞද්ගලික) සමාගම වන උකස්කරු මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ එකී අංක 414 සහ 5386 දරන උකස්කරයන් යටතේ උකස් කර ඇති බැවිනුත් එකී උකස්කරයන් මත දැනට රුපියල් පන් කෝටි හැට ලක්ෂ හතලිස් හය දහස් අටසීය හැට අටකුත් ශත විසි දෙකක (රු.56,046,868.22) මුදල සහ රුපියල් හැට දෙලක්ෂ අනූ දෙදාහස් හත් සිය හැට හතයි ශත අනූ නවයක (රු. 6,292,767.99) මුදල් සහ එකී උකස් කරයන් මත පොළී මුදල් සමග මහජන බැංකුවට ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇත.

එකී මුදල වන රුපියල් පන් කෝටි හැට ලක්ෂ හතලිස් හය දාහස් අට සීය හැට අටයි ශත විසි දෙකක (රු.56,046,868.22) මුදලක් සහ රුපියල් හැට දෙලක්ෂ අනූ දෙදාහස් හත්සිය හැට හතයි ශත අනූ නවයක (රු.6,292,767.99) මුදල් සහ තවදුරටත් 2012 මාර්තු 27 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හතයි දශම බිංදුව (27.0%) බැගින් වූ වෙන්දේසි දිනය තෙක් රුපියල් පන් කෝටි හතලිස් අට ලක්ෂ හැත්තෑ අට දාහස් දෙසීය තිහයි ශත හතලිහක (රු.54,878,230.40) මුදල් සමග රුපියල් පනස් ලක්ෂ (රු.5,000,000.000) මුදල් සඳහා පොළී මුදල් සහ මහජන බැංකු පනතේ 29(L) වගන්තිය යටතේ අයකර ගත හැකි විකිණීමේ වියදම් ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් ඇත්නම් එම මුදල අඩුකර අදාළ මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකරු Ms ඊ. එම්. රාමනායක විසින් එකී අංක 414 සහ 5386 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ උපලේඛනය

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ හෙනරත්ගොඩ හි පිහිටි, කහටගහ වත්ත නොහොත් කහටගහ ලන්ද යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් මහතා විසින් සාදන ලද 1996.02.03 දිනැති අංක 14/96 පිඹුරෙහි කැබලි අංක 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි වැවිල්ල සහ ඊට අයත් සියලු දේ සමග එකී අංක 1 ඉඩමට මායිම් උතුරට : එස් මහා ආරච්චිට අයත් ඉඩම සහ නැගෙනහිරට : අංක 3 සහ 2 දරන ඉඩම් කැබලි ද, දකුණට : බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් මහතා විසින් සාදන ලද අංක 2/94 පිඹුරෙහි කැබලි අංක 2 සහ බී වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කැබලි ද, බස්නාහිරට : අංක 7115 පී දරන පිඹුරෙහි කැබලි අංක 01 වශයෙන් ලකුණු කර ඇති ඉඩමක්ද, මායිම් වූ එකී අංක 14/96 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි බිංදුවයි (අක්. 0, රූ. 0, පර්. 12.50) හෝ හෙක්ටයාර් 0.0316 විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී. 62/100 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී හෙනරත්ගොඩ හි පිහිටි කහටගහවත්ත නොහොත් කහටගහ ලන්ද යයි කියනු ලබන ඉඩම අංක 14/96 පිඹුරෙහි කැබලි අංක 2 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි වැවිල්ල සහ ඊට අයත් සියලු දේ සමග එකී අංක 2 දරන ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : කැබලි අංක 1 3 සහ (H) දරන පාර ද, නැගෙනහිරට : ඉහත කී අංක 2/94 පිඹුරෙහි කැබලි අංක B සහ (H) දරන පාර ද, දකුණටː අංක 2/94 පිඹුරෙහි කැබලි අංක B දරන ඉඩම් කැබැල්ලක් ද, බස්නාහිරට : කැබලි අංක 01 සහ 03 ද මායිම් වූ එකී අංක 14/96 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතරයි බිංදුවයි (අක්. 0, රූ. 0, පර්. 30.40) හෝ හෙක්ටයාර් 0.0769 විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී. 62/101 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී හෙනරත්ගොඩ හි පිහිටි කහටගහ වත්ත නොහොත් කහටගහ ලන්ද යයි කියනු ලබන ඉඩම අංක 14/96 පිඹුරෙහි කැබලි අංක 3 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල සහ ඊට අයත් සියලු දේ සමග. එකී අංක 3 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : එස්. මහා ආරච්චිට අයත් ඉඩම සහ නැගෙනහිරට : කැබලි අංක 2 සහ (H) දරන පාර ද දකුණට : කැබලි අංක 2 දරන ඉඩම් කැබැල්ලක් ද බස්නාහිරට : කැබලි අංක 01 සහ එස් මහාරච්චිට අයත් ඉඩම ද, මායිම් වූ එකී අංක 14/96 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම එකයි බිංදුවයි (අක්. 0, රූ. 0, පර්. 3.10) හෝ හෙක්ටයාර් 0.0078 විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී. 62/102 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ඉහත කී හෙනරත්ගොඩ හි පිහිටි කහටගහවත්ත නොහොත් කහටගහ ලන්ද යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජා මහතා විසින් සාදන 1995.07.06 දිනැති අංක 1627 පිඹුරෙහි කැබලි අංක 5 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල සහ ඊට අයත් සියලු දේ සමග. එකී අංක 5 දරන ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩී. ටී. පී. රෙජිනෝල්ඩ් මහතා විසින් සාදන ලද 1994.01.31 දිනැති අංක 2/94 පිඹුරෙහි කැබලි අංක 9 සහ 11 වශයෙන් ලකුණු කර ඇති ඉඩම් සහ නැගෙනහිරට : කැබලි අංක 6 ද, දකුණට : කැබලි අංක 6 සහ 9 දරන ඉඩම් කැබලි ද, බස්නාහිරට : කැබලි අංක 04 ද මායිම් වූ එකී අංක 1627 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහ හතයි දශම හයක් (අක්. 0, රූ. 0, පර්. 17.6) හෝ හෙක්ටයාර් 0.0445 විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී. 49/225 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කැබැල්ල ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

එකී හෙනරත්ගොඩ හි පිහිටි, කහටගහ වත්ත නොහොත් කහටගහ ලන්ද යයි කියනු ලබන ඉඩමේ අංක 1627 පිඹුරෙහි කැබලි අංක 9 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද එකී ඉඩමක් (පළලින් අඩි 10 කින් යුත් පාර සඳහා වෙන් කර ඇති) එකි අංක 9 දරන ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : කැබලි අංක 1, 4 සහ 05 වශයෙන් ලකුණු කර ඇති ඉඩම් සහ නැගෙනහිරට : කැබලි අංක 6 ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : කැබලි අංක 03 වශයෙන් ලකුණු කර ඇති කේ. කේ. විජේරත්නට අයත් ඉඩමක් ද මායිම් වූ එකී අංක 1627 පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම දෙකක (අක්. 0, රූ. 0, පර්. 11.2) විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 62/22 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

(1) බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මැද පත්තුවේ, ගම්පහ මහ නගර සභා පරිපාලන සීමාව තුළ අළුත්ගම හි පිහිටි කපුහේන යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එච්. පී. කෝට්ටෙගොඩ මහතා විසින් සාදන ලද 1980.01.11 දිනැති අංක 841 පිඹුරෙහි කැබලි අංක 6 අ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ලි සහ ඊට අයත් සියලු දේ සමග. එකී කැබලි අංක 6 අ දරන ඉඩමට මායිම් උතුරට : එදිරිසූරිය මහත්මියට අයත් ඉඩම සහ නැගෙනහිරට : කැබලි අංක 6 ඈ දරන ඉඩම් කැබැල්ලක් ද, දකුණට : කැබලි අංක 8 වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කැබැල්ලක් ද, බස්නාහිරට : මහ පාර ද මායිම්වූ එකී අංක 841 පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී 47/232 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 6 අ වශයෙන් දක්වා ඇති ඉඩම් කැබැල්ල මැත දී සාදන ලද පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

එකී අළුත්ගම හි පිහිටි, කපුහේන යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. පී. රණසිංහ මහතා විසින් සාදන ලද 2005.11.15 දිනැති අංක 29/2005 පිඹුරෙහි කැබලි අංක 6 අ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල සහ ඊට අයත් සියලු දේ සමග. එකී කැබලි අංක 6 දරන ඉඩමට මායිම් උතුරට : කේ. ඒ. ආනන්ද ලයනල් ට අයත් ඉඩම සහ නැගෙනහිරට : ඉහත සඳහන් කල එකි ඉඩමේ කැබලි අංක 6 ඈ දරන ඉඩම් කැබැල්ල ද, දකුණට : ඉහත සඳහන් කල එකී ඉඩමේ කැබලි අංක 8 ද දැනට එය සමරතුංග මාවත යනුවෙන් හඳුන්වනු ඇත. බස්නාහිරට : යක්කල ගම්පහ මහ පාර ද මායිම් වූ එකී අංක 29/2005 පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.10117 විශාලත්වයක් ඇති ඉඩමක් වේ.

2. ඉහත කී අළුත්ගම හි පිහිටි, කපුහේන යයි කියනු ලබන ඉඩම අංක 841 පිඹුරෙහි කැබලි අංක 6 ඈ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල සහ ඊට අයත් සියලු දේ සමග. එකී කැබලි අංක 6 ඈ දරන ඉඩමට මායිම් උතුරට : එදිරිසූරිය මහත්මියට අයත් ඉඩම සහ නැගෙනහිරට කැබලි අංක 6E දරන ඉඩම ද, දකුණට කැබලි අංක 8 ද, බස්නාහිරට : කැබලි අංක 6 අ දරන ඉඩම ද, මායිම් වූ එකී අංක 841 පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් (අක්. 0, රූ. 1, පර්. 0) විශාලත්වයක් ඇති එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 44/25 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 6 ඈ වශයෙන් දක්වා ඇති ඉඩම් කැබැල්ල මෑතක දී සාදන ලද පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

එකී අළුත්ගම හි පිහිටි කපුහේන යයි කියනු ලබන ඉඩම බලයලත් මිනින්දෝරු එම්. පී. රණසිංහ විසින් සාදන ලද 2005.11.15 දිනැති අංක 28/2005 පිඹුරෙහි කැබලි අංක 6 ඈ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල සහ ඊට අයත් සියලු දේ සමග. එකී කැබලි අංක 6 ඈ දරන ඉඩමට මායිම් උතුරට : කේ. ඒ. ආනන්ද ලයනල් ට අයත් ඉඩම සහ නැගෙනහිරට : එස් රූපසිංහ මහත්මියට අයත් කැබලි අංක 6E දරන ඉඩම් කැබැල්ල ද, දකුණට : ඉහත සඳහන් කල එකී ඉඩමේ කැබලි අංක 8 ද දැනට එය සමරතුංග මාවත යනුවෙන් හඳුන්වනවා ඇත. බස්නාහිරට : ඉහත සඳහන් කළ ඉඩමේ කැබලි අංක 6 (අ) ද, මායිම් වූ එකී අංක 28/2005 පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් (අක්. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.10117 විශාලත්වයක් ඇති ඉඩමක් වේ.

ඉහත අංක 28/2005 පිඹුරෙහි දක්වා ඇති පාරක් සඳහා වෙන් කර ඇති මාර්ග අයිතිය ද සමග පහත සඳහන් ඉඩම් කැබැල්ල ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී අළුත්ගම පිහිටි කපුහේන යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එච්. පී. කෝට්ටේගොඩ මහතා විසින් සාදන ලද 1974.12.08 දිනැති අංක 74/7 පිඹුරෙහි කැබලි අංක 8 (මාර්ගයක්) වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩමක් වන කැබලි අංක 8 දරන ඉඩමට මායිම් උතුරට :කැබලි අංක 5,4, 3 සහ 6 (අ) ද, නැගෙනහිරට : කැබලි අංක 2 ද, දකුණට : කැබලි අංක 7 සහ දොස්තරට අයත් ඉඩම ද (වඩා නිවැරදිව කිවහොත් ජයසේකර සහ අනෙක් අයට අයත්) ඉඩම ද, බස්නාහිරට : ප්‍රසිද්ධ පාර ද (වඩා නිවැරදිව කිවහොත් ගම්පහ යක්කල පාර ද) මායිම් වූ, එකී අංක 74/7 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරක් (අක්. 0, රූ. 1, පර්. 24) විශාලත්වයක් ඇති ඉඩමක් වේ. එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ජී. 44/250 යටතේ ලියාපදිංචි කර ඇත.

**තෙවන උපලේඛනය**

ඉහත කී අළුත්ගම හි පිහිටි කපුහේන හෙවත් බණ්ඩාරවත්ත යයි කියනු ලබන ඉඩමේ අංක 841 පිඹුරෙහි කබැලි අංක 7 අ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, වැව්ල්ල

සහ ඊට අයත් සියලු දේ සමග. එකී කැබලි අංක 7 අ දරන ඉඩමට මායිම් උතුරට : කැබලි අංක 7 ඇ ද, නැගෙනහිරට : ජයනායක සහ අනෙක් අයට අයත් ඉඩම ද, දකුණට : මහා පාර ද බස්නාහිරට : කැබලි අංක 8 ද මායිම් වූ එකී අංක 841 පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් පර්චස් එකයි දශම හතරයි (අක්. 0, රූ. 1, පර්. 1.14) විශාලත්වයක් ඇති ඉඩමක් වේ. එකී ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 62/103 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු,
(අය කිරීම්).

2012 මැයි මස 24 වැනි දින,
මහජන බැංකුව,
බැංකු ආයතන ශාඛාව,
ANCL ගොඩනැගිල්ල,
කොළඹ 10,

07-372

---

**මහජන බැංකුව - ඕල්කොට් මාවත**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටත් යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. නන්දනී පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2006.08.08 දිනැති අංක 3800 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම.

රාජපක්ෂ සේනාධිපතිගේ විකුම් රංනිම යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී අංක 3800 දරන උකස්කරය යටතේ දැනට රුපියල් නවලක්ෂ හැත්තෑපන්දහස් අටසිය හතයි ශත හතලිස් පහක (රු.975,807.45) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී රුපියල් නවලක්ෂ හැත්තෑපන්දහස් අටසිය හතයි ශත හතලිස් පහක (රු.975,807.45) මුදල සහ 2009.05.12 දින සිට වර්ෂයකට 15% බැගින් වෙන්දිසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අය කර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. නන්දනී පෙරේරා මහත්මිය විසින් 2006.08.08 දින සහතික කළ අංක. 3800 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ වාද්දු වස්කඩු දෙබැද්දේ, කළුතර ප්‍රාදේශීය සභාවේ වස්කඩුව උප කාර්යාල බල සීමාවේ කුඩාගෝනාදූවේ පිහිටි බැල්ලපිටිය වත්ත නමැති ඉඩමට පී. ඩබ්. එස්. සී. විතාන අවසරලත් මිනින්දෝරු තැන 2005.10.03 වැනි දින සාදන ලද පිඹුරු අංක 1791 ඒ හි දැක්වෙන කැබලි අංක 2 ඒ දරන ඉඩමට මායිම් ලෙස, උතුරට : පිඹුරු අංක 1663 හි කැබලි අංක 02 දරන ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 03 දරන ඉඩම ද, දකුණට : වස්කඩුවේ සිට බණ්ඩාරගම දක්වා ඇති මහ පාර සහ බස්නාහිරට : පිඹුරු අංක 1663 හි කැබලි අංක 2 දරන ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම පහයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 19.50) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියලු දේද වේ.

(මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 172/230 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර.)

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කළාපය -01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

07-371

---

**සෙලාන් බැංකුව පීඑල්සී**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.04.29 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : සංස්ථා බැංකු ව්‍යාපාර ඒකකය
ගිණුම් අංකය : 0864-601249-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝදි විසින් සහතික කරන ලද 2002 දෙසැම්බර් 4 දිනැති අංක 972 සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් සහතික කරන ලද 2008 නොවැම්බර් 19 දිනැති අංක 1569 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 02 හි ලියාපදිංචි අංක පීවී 1929 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ, යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ලංකා ඔරිගනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් එක්කෝටි හතලිස් දෙලක්ෂ පනස්තුන් දහස් අටසිය අනූපහයි ශත අසූ හතරක (රු.1,42,53,895.84) මුදලක්, 2012 නොවැම්බර් 7 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,42,53,895.84 මුදල ද, 2012 නොවැම්බර් 8 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී

අංක : 972 සහ 1569 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාසය තුල අඹගමුව කෝරලේ මයිනර් ඩිවිෂන් හි වටවල ගමේ පිහිටි ගොඩනැගිලි සහ වගා සමග වටවල එස්ටේට් නැමති ඉඩමේ ලොට් ඒ ලකුණු කල (බලයලත් මිනින්දෝරු පී. ගාල්ලගේ විසින් සාදන ලද සහ 1990 මාර්තු 30 දිනැති අංක 14/90 සැලැස්මේ ලොට් 3 හි කොටසක් වන සහ 1980 මැයි 14 දිනැති අංක 1701 දරන මිනුම්පතිගේ මූලික සැලැස්මේ සඳහන් ලොට් 3 හි කොටසක් ලෙසද පෙන්නුම් කරනු ලබන සහ අංක 45605 දරන හිම්කම් සැලැස්මේ ද යොමුවක් ඇති) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: මහවැලි ගඟ අංක පී. පී. 1701 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස සහ 1990.03.30 දිනැති අංක 14/90 සැලැස්මේ සඳහන් ලොට් 3 ද, නැගෙනහිරට : මහවැලි ගඟ අංක පී. පී. 1701 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස ද, දකුණට : අංක පී. පී. 1701 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස : සහ බස්නාහිරට : පෙර කී අංක 14/90 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස ද යන මායිම් තුල අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් විසිපහක් (අ. 2, රූ. 3, පර්. 25) ක් විශාල, ඉඩම.

එකී ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටස දැන් නැවත මැන අතුරු බෙදීමක් කර ඇති අතර දැන් පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දැන් නුවරඑළිය අඹගමුව කෝරළේ අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 ජනවාරි 10 දිනැති අංක 9443 දරන සැලැස්මේ නිරූපනය වන වටවල එස්ටේට් නමැති ඉඩම් කොටසේ වන ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම් උතුරට : ඇල ද, නැගෙනහිරට : මහවැලි ගඟ ද, දකුණට : පී. පී. මහ 1701 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස සහ වයඹට : ඇල ද යන මායිම් තුල රූඩ් දෙකයි පර්චස් හතරයි දශම අටක් (අ. 0, රූ. 2, පර්. 4.8) ක් නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි එකයි හතරයි තුනක් (හෙක්ටයාර 0.2143) විශාල, ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දැන් නුවරඑළිය අඹගමුව කෝරළේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුල පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2000 ජනවාරි 10 දිනැති අංක 9443 දරන සැලැස්මේ නිරූපනය යන වටවල එස්ටේට් නමැති ඉඩමේ කොටසක් වන ලොට් 2 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මහවැලි ගඟ ද, නැගෙනහිරට : මහවැලි ගඟ ද, ගිණිකොණට : ඇල ද, බස්නාහිරට : පී. පී. මහ 1701 සැලැස්මේ සඳහන් ලොට් 3 හි ඉතිරි කොටස යන මායිම් තුල අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම හතක් (අ. 1, රූ. 2, පර්. 28.7) ක් නොහොත් හෙක්ටයාර් දශම හයයි අටයි බිංදුවයි බිංදුවක් (හෙක්ටයාර 0.6800) විශාල, ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිණි - නීති

07-249/1

---

පීවී 60256.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "ඉනෝවා ස්ටඩි ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.06.14 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඉනෝවා ස්ටඩි ගෲප්(ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඉනෝවා ස්ටඩි ගෲප්(ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජුනි මස 15 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-339

---

පීවී 17188.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "යැරොව් එස්ටේට්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් ආඥාපනත විධිවිධාන යටතේ 1946.08.28 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "යැරොව් එස්ටේට්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "යැරොව් එස්ටේට්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජුනි මස 15 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-340

පීවී 21705.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ගුණසේන රබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2006.06.02 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ගුණසේන රබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ගුණසේන රබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජුනි මස 15 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-341

---

පීවී 76957.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සන් කේබල් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.02.02 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සන් කේබල් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සන් කේබල් සිස්ටම් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජුනි මස 15 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-337

පීවී 86855.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "හාවස්ට් ඩෙස්ටිනේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.07.04 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "හාවස්ට් ඩෙස්ටිනේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "හාවස්ට් ඩෙස්ටිනේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 ජුනි මස 15 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-338

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පිටකොටුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.04.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0640-517712-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රශ්‍රී සිවදාසන් විසින් දෙකම සහතික කරන ලද 2007 ජනවාරි 5 දිනැති අංක 523 සහ 2008 ඔක්තෝබර් 21 දිනැති අංක 697 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 01 හි ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 8135 දරන 1982 අංක 17 දරන

සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (අංක පීවී 7263 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද) එප්සි කම්පියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, දෙදෙනාම කොළඹ 03 පදිංචි මුහුන්දන් කනගසූරියම් සහ ධරිනි මුහුන්දන් (විවාහයට පෙර පුවරාජසිංහම්) ධරිනි කනගසූරියම් යනුවෙන්ද හඳුන්වනු ලබන යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි හතළිස් පන්ලක්ෂ හතළිස් අටදහස් එකසිය එකොළහයි ශත හතළිස් තුනක (රු.3,45,48,111.43) මුදලක්, 2012 දෙසැම්බර් 12 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 3,45,48,111.43 මුදල ද, 2012 දෙසැම්බර් 13 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 523 සහ 697 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුල මිලාගිරිය වෝඩ් අංක 39 රම්‍යා පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1975 ජනවාරි 6 දිනැති අංක : 1737 දරන සැලැස්මේ සඳහන් වරිපනම් අංක 11 (කොටසක්) දරන අප්පුහාමිගේවත්ත නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කල සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට රම්‍යා පාර ද, නැගෙනහිරට : ලොට් 1 බී ද, දකුණට : ගෲබෙරි ගාඩින්ස් වරිපනම් අංක 20/1 සහ 20/2 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : රම්‍යා පාර වරිපනම් අංක 17 දරන පරිශ්‍රය ද යන මායිම් තුල එකී අංක 1737 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්.9) ක් විශාල, ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 926/280 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු ගාමිනී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2004.08.03 දිනැති අංක : 4968 දරන මෑතක මිනුම් සැලැස්මක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුල මිලාගිරිය වෝඩ් අංක 39 බම්බලපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිනි බී. දොඩන්වෙල විසින් සාදන ලද 2004.08.03 දිනැති අංක 4968 දරන සැලැස්මේ නිරූපනය වන රම්‍යා පාර වරිපනම් අංක 15 දරන අප්පුහාමිගේවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල (බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 1975 ජනවාරි 6 දිනැති අංක 1737 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ඒ හි නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : රම්‍යා පාර ද, නැගෙනහිරට : රම්‍යා පාර වරිපනම් අංක 11 දරන පරිශ්‍රය ද, දකුණට : ගෲබෙරි ගාඩින්ස් වරිපනම් අංක 22/1ඒ සහ 22/1 දරන පරිශ්‍රයන් ද, බස්නාහිරට : රම්‍යා පාර වරිපනම් අංක 17 දරන පරිශ්‍රය ද යන මායිම් තුල එකී අංක 4968 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අ. 0, රූ. 0, පර්. 9) ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිණි - නීති.

07-249/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.